සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I
கிரேக்க, உரோம நாகரிகம் I
Greek and Roman Civilization I

48 STE I

2019.08.28/ 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය / சுட்டெண் / Index No ................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்.
**For Examiner's use only.**

| ප්‍රශ්න අංක<br>வினா இல.<br>Question No. | ලකුණු<br>புள்ளிகள்<br>Marks |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව<br>மொத்தம்<br>Total | |

| | අත්සන<br>கையொப்பம<br>Signature | සංකේත අංකය<br>குறியீட்டு எண்<br>Code Number |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ<br>1 வது பரீட்சகர்<br>1st Examiner's | | |
| 2 වන පරීක්ෂකගේ<br>2 வது பரீட்சகர்<br>2 nd Examiner's | | |
| අතිරේක / ප්‍රධාන පරීක්ෂකගේ<br>மேலதிக / பிரதான பரீட்சகர்<br>Additional/Chief Examiner's | | |
| ගණිත පරීක්ෂකගේ<br>எண்கணிதப் பரிசோதகர்<br>Arithmetic Checker | | |
| ප්‍රධාන පරීක්ෂකගේ<br>பிரதான பரீட்சகர்<br>Chief Examiner's | | |

[2 වැනි පිටුව බලන්න/பக். 2 ஐப் பார்க்க/See page two

**ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I** | **පැය දෙකයි**

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **I** කොටසෙහි **1** සිට **30** දක්වා ඇති ප්‍රශ්නවලට **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.
* **II** කොටසෙහි **31** සිට **50** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති තිත්ඉර මත ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතුයි.

## I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

**1.** ග්‍රීකවරුන්ගේ ප්‍රධාන බෙදීම් හතර පිළිබඳව සඳහන් වන්නේ පහත දැක්වෙන කුමන වරණයේ ද?
(1) ඉලීරියන්වරු, ඩෝරියන්වරු, අයෝනියන්වරු, ස්කිතියන්වරු
(2) ස්පාර්ටන්වරු, ලැකෝනියන්වරු, ඇතීනියන්වරු, තීබන්වරු
(3) ඩෝරියන්වරු, එයෝලියන්වරු, අකෙයන්වරු, අයෝනියන්වරු
(4) ඩෝරියන්වරු, තෙසේලියන්වරු, එයෝලියන්වරු, ආගයිව්වරු
(5) ලැකෝනියන්වරු, ආර්යන්වරු, එයෝලියන්වරු, ඊජියන්වරු (......)

**2.** හෝමර් විස්තර කළ වීරවරයින්ගේ යුගයේ පැවති ග්‍රීක දේශපාලන ක්‍රමය සම්බන්ධයෙන් **අසත්‍ය** වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශය ද?
(1) ග්‍රීසිය උරුමයෙන් බලයට පත් රජවරු පාලනය කළ නිදහස් රාජ්‍ය ගණනාවකට බෙදා තිබුණි
(2) රජු යුධ කාලයක දී ප්‍රධාන අණ දෙන නිලධාරියා ලෙසත්, සාමකාමී කාලයේ දී ප්‍රධාන විනිසුරුවරයා ලෙසත් සහ ජනතාවගේ ප්‍රධාන පූජකවරයා ලෙසත් ක්‍රියා කරන ලදී
(3) බූලේ නොහොත් ප්‍රධාන සභාව රජුගේ බලතල පාලනය කරන ලදී
(4) රජු බූලේ සභාවේ සහ අගොරා සභාවේ අවවාද සහ අනුමැතිය ලබා ගන්නා ලදී
(5) රජුගේ බලතල පාලනය කළ නීති බොහෝමයක් පැවතිණි (......)

**3.** ඇම්ෆික්ටියානු සභාව පිළිබඳ නිවැරදි වන්නේ පහත ප්‍රකාශ කුමන ප්‍රකාශ දෙක ද?
A - ඩෙල්ෆීහි වූ ඇපොලෝ දෙවියන්ගේ දේවස්ථානයෙහි රැස්වීම් පැවැත්විණි.
B - පර්සියාවෙන් එවන ලද නියෝජිතයන්ගෙන් සමන්විත විය.
C - වාර්ෂිකව රැස් වී ඩෙල්ෆීහි සියලු දේශපාලන කරුණු සම්බන්ධ ප්‍රශ්න සාකච්ඡා කරන ලදී.
D - වසරකට දෙවරක් රැස් වී ඩෙල්ෆී දේවස්ථානය පිළිබඳව වූ සියලු ප්‍රශ්න සාකච්ඡා කරන ලදී.
E - ඇතීනියානු නායකත්වය යටතේ වූ ග්‍රීක නොවන රාජ්‍යයන්ගෙන් යුතු ආගමික නොවන සංවිධානයක් විය.

(1) A සහ B (2) A සහ D (3) B සහ D (4) C සහ E (5) D සහ E (......)

**4.** පහත වගුවේ **පළමු තීරුව** මගින් ක්‍රීඩා ද **දෙවන තීරුව** මගින් ක්‍රීඩා පැවැත්වූ ස්ථාන ද දැක්වේ.

| පළමු තීරුව | දෙවන තීරුව |
|---|---|
| ඔලිම්පික් ක්‍රීඩා | A - ආර්ගොලිස් |
| ඉස්මියානු ක්‍රීඩා | B - කොරින්ත් |
| පිතියානු ක්‍රීඩා | C - ඩෙල්ෆී |
| නිමියානු ක්‍රීඩා | D - එලිස් හි ඔලිම්පියා |

ක්‍රීඩා අනුපිළිවෙළ අනුව ඒවා පැවැත්වූ ස්ථාන නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.
(1) A, B, C, D (2) B, C, A, D (3) B, D, A, C (4) C, B, A, D (5) D, B, C, A (......)

● පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරින් **5** වන සහ **6** වන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - අවුරුදු හැට ඉක්මවූ ස්පාර්ටානු නගර වැසියන් තිස්දෙනෙකුගෙන් යුතු විය.
B - සාමාජිකයන් ජනතාව අතුරෙන් නොව ජනතාව විසින් පත්කර ගන්නා ලදී.
C - අවුරුදු තිහ ඉක්මවූ ස්පාර්ටානු නගර වැසියන්ගෙන් යුතු විය.
D - නීති පනවන ලද අතර සාමය සහ යුද්ධය සම්බන්ධ තීරණ ගන්නා ලදී.
E - ව්‍යවස්ථාදායක මෙන්ම උපදේශක මණ්ඩලයක් ලෙස ද ක්‍රියා කරන ලදී.

**5.** ස්පාර්ටානු 'ගෙරුසියාව' විස්තර කරනුයේ ඉහත දැක්වෙන කුමන ප්‍රකාශවලින් ද?
(1) A, B, C (2) A, B, E (3) B, C, D (4) B, D, E (5) C, D, E (......)

**6.** ස්පාර්ටානු 'අපෙල්ලාව' විස්තර කරනුයේ ඉහත දැක්වෙන කුමන ප්‍රකාශවලින් ද?
(1) A, B (2) B, C (3) B, D (4) C, D (5) D, E (......)

0585

7. 'තෙස්මොතෙටායි' ලෙසින් පොදුවේ හඳුන්වන ලද්දේ,
(1) සෝලොන්ට පෙර ඇතැන්ස්හි ආණ්ඩුව පාලනය කළ මුල් ආකන්වරු තිදෙනා ය.
(2) සෝලොන්ට පෙර ඇතැන්ස්හි අධිකරණ කටයුතු සිදු කළ ආකන්වරු සයදෙනෙකුගෙන් යුතු මඩුල්ල ය.
(3) එසෙම්බ්ලියට සහභාගි වීමේ අයිතිය හිමි වූ නිදහස් ඇතීනියානු වැසියන් ය.
(4) දේශපාලන අයිතිය හිමි නොවූ ඇතීනියානු නගර වැසියන් ය.
(5) ආකන්වරු පාලනය කළ විශ්‍රාමික ආකන්වරුන්ගේ මණ්ඩලයයි. (……)

8. සෝලොන්ගේ සාමාජීය ප්‍රතිසංස්කරණ පිළිබඳව සඳහන් කරන පහත දැක්වෙන **ප්‍රකාශය** සහ **හේතුව** ඇසුරින් නිවැරදි වරණය තෝරන්න.
**ප්‍රකාශය** : සෝලොන්ගේ සමාජීය ප්‍රතිසංස්කරණ ජනතාවගේ පීඩා දුරලන ලදී.
**හේතුව** : සෝලොන් 'සෙයිසක්තෙයියා' ක්‍රමය හඳුන්වා දෙන ලදී.
(1) ප්‍රකාශය සහ හේතුව යන දෙකම නිවැරදි වන අතර ඒවා එකිනෙකට සම්බන්ධව පවතී.
(2) ප්‍රකාශය සහ හේතුව යන දෙකම නිවැරදි වන නමුත් ඒවා අතර සම්බන්ධයක් නොමැත.
(3) ප්‍රකාශය පමණක් නිවැරදි වන අතර හේතුව වැරදි වේ.
(4) ප්‍රකාශය වැරදි වන අතර හේතුව නිවැරදි වේ.
(5) ප්‍රකාශය සහ හේතුව යන දෙකම වැරදි වේ. (……)

● පර්සියානු යුද්ධ පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ කියවා **9** සිට **11** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - තෙමිස්ටෝක්ලීස්ගේ උපක්‍රමය පර්සියානු නැව් සලමිස් අසල සමුද්‍ර සන්ධියට යැවීම සඳහා සර්ක්සීස්ව පෙළඹවීමයි.
B - සාර්ඩිස් නුවර ගිනිබත් කිරීම නිසා කෝපාවිෂ්ට වූ ඩේරියස් රජු අයෝනියානු කැරැල්ල මැඩපැවැත්වීමට ප්‍රබල ක්‍රියාමාර්ග ගැනීම.
C - ක්‍රි. පූ. 490 දී මිලිටියඩීස්ගේ නායකත්වය යටතේ යුද්ධයට ගිය ඇතීනියානුවන් පර්සියානුවන් පරාජය කිරීම.
D - ඇතීනියානු සහ ස්පාර්ටන්වරුන්ගෙන් යුතු වූ ඒකාබද්ධ හමුදා පර්සියානුවන්ට එරෙහිව ලෙයොනිඩාස් යටතේ සටන් කිරීම.
E - පර්සියානුවන් පරාජය වූ අතර පර්සියානු නාවික හමුදාව ද විනාශ වීම.

9. පර්සියානු යුද්ධයට හේතු වූ ආසන්න කරුණක් සඳහන් වන්නේ ඉහත කවර ප්‍රකාශයේ ද?
(1) A (2) B (3) C (4) D (5) E (……)

10. මැරතන් සංග්‍රාමය පිළිබඳවත් තර්මොපිලායි සංග්‍රාමය පිළිබඳවත් පිළිවෙළින් සඳහන් වන්නේ ඉහත කවර ප්‍රකාශ දෙකෙහි ද?
(1) A සහ C (2) A සහ E (3) C සහ D (4) C සහ E (5) D සහ E (……)

11. සලමිස් සංග්‍රාමය පිළිබඳව සඳහන් වන්නේ ඉහත කවර ප්‍රකාශ දෙකෙහි ද?
(1) A සහ B (2) A සහ D (3) A සහ E (4) C සහ D (5) D සහ E (……)

12. ඩීලියානු එක්සත් මණ්ඩලය පිළිබඳ ව පහත දැක්වෙන **ප්‍රකාශය** සහ **හේතුව** ඇසුරින් ඒවා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
**ප්‍රකාශය** : ඇතීනියානු නායකත්වය යටතේ ඊජියානු මුහුදේ පිහිටි නාවික රාජ්‍යයන් එක්වී ස්වෙච්ඡාවෙන් පිහිටුවා ගත් මණ්ඩලයකි.
**හේතුව** : පෝසානියස්ගේ අහංකාරකම ඒකාබද්ධ හමුදාවන්ට අණදීම පිණිස ඇරිස්ටයිඩීස් පත්කිරීමට හේතු විය.
(1) ප්‍රකාශය සහ හේතුව යන දෙකම නිවැරදි වන අතර ඒවා එකිනෙකට සම්බන්ධව පවතී.
(2) ප්‍රකාශය සහ හේතුව යන දෙකම නිවැරදි වන නමුත් ඒවා අතර සම්බන්ධයක් නොමැත.
(3) ප්‍රකාශය පමණක් නිවැරදි වන අතර හේතුව වැරදි වේ.
(4) ප්‍රකාශය වැරදි වන අතර හේතුව නිවැරදි වේ.
(5) ප්‍රකාශය සහ හේතුව යන දෙකම වැරදි වේ. (……)

13. 'හෙලනෝටමියායි' යනු ඩීලියානු එක්සත් මණ්ඩලයේ,
(1) නාවික හමුදාවට අණ දුන් ස්පාර්ටන් නිලධාරීන් ය.
(2) නීතිගරුක නොවූ සාමාජිකයින්ට දඬුවම් කළ ඇතීනියානු නිලධාරීන් ය.
(3) පොදු නාවික බල ඇණියට නාවික යාත්‍රා සැපයූ සාමාජිකයින් ය.
(4) පොදු භාණ්ඩාගාරයට වාර්ෂිකව මුදල් ගෙවූ සාමාජිකයන් ය.
(5) සාමාජික මුදල් එකතු කළ ඇතීනියානු නිලධාරීන් ය. (……)

[4 වැනි පිටුව බලන්න/பக். 4 ஐப் பார்க்க/See page four

- **14** සහ **15** වන ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - ෆිලිප්පී නමින් නගරයක් පිහිටුවන ලදී

B - ඇම්ෆිපොලිස් යටත් කර ගන්නා ලදී

C - එලටෙයියා යටත් කර ගන්නා ලදී

D - ඇම්ෆික්ටියානු සභාව ආගමික දේපළ කෙලසීම සම්බන්ධයෙන් ඇම්ෆිස්සා රාජ්‍යය වරදකරු ලෙස ප්‍රකාශ කරන ලදී

E - ක්‍රි.පූ. 338 කයිරෝනියා යුද්ධයෙන් මැසිඩෝනියාව ජය අත් කර ගන්නා ලදී

**14.** මැසිඩෝනියානු ෆිලිප් රජු පැන්ගායස් කන්දේ රන් ආකර අත්පත් කර ගැනීම හා සම්බන්ධ වන්නේ ඉහත කවර ප්‍රකාශ දෙක ද?

(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) B සහ E (5) C සහ D (……)

**15.** මැසිඩෝනියාවේ ෆිලිප් ග්‍රීසියේ කටයුතුවලට ඇඳුනු සිද්ධිය සඳහන් වන්නේ ඉහත දැක්වෙන කුමන ප්‍රකාශයේ ද?

(1) A (2) B (3) C (4) D (5) E (……)

**16.** පහත දැක්වෙන ප්‍රකාශ කියවා අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - රෝම ජනතාව සකස් වී ඇත්තේ ලතින්වරු, සැබයින්වරු සහ එට්රස්කන්වරුන්ගේ එකතු වීමෙනි.

B - එය ලතින්වරුන්ගෙන් තම දේශසීමා ආරක්ෂා කර ගැනීම පිණිස එට්රස්කන්වරුන් ජනපදයක් සේ පිහිටුවා ගන්නා ලදී.

මෙම ප්‍රකාශ දෙක අතරින්,

(1) A නිවැරදි වන අතර B වැරදි ය.

(2) A වැරදි වන අතර B නිවැරදි ය.

(3) A සහ B දෙකම නිවැරදි ය.

(4) A සහ B දෙකම වැරදි ය.

(5) B පමණක් නිවැරදි වන අතර A සිදුවන්නේ B හි ප්‍රතිඵලයක් ලෙසිනි. (……)

**17.** සර්වියස් ටුල්ලියස් හඳුන්වා දුන් ව්‍යවස්ථායික ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත දැක්වෙන කුමන ප්‍රකාශ දෙක ද?

A - එහි අරමුණ වූයේ බදු බර සහ හමුදා සේවය රදළයන්ට සීමා කිරීමයි.

B - මෙහිදී අනුගමනය කළ ප්‍රතිපත්තිය වූයේ දේශපාලන බලය සහ වරප්‍රසාද උපත මත නොව ධනය මත තීරණය විය යුතු බවයි.

C - ජනයා ඔවුන් ජීවත් වූ ස්ථානයට අනුව ගෝත්‍ර 21 කට බෙදන ලදී.

D - මෙම ගෝත්‍ර පැට්‍රිෂියන්වරුන්ගෙන් පමණක් සමන්විත විය.

E - සංගණනයකට අනුව මුළු ජනගහනයම නැවතත් කණ්ඩායම් දහයකට බෙදන ලදී.

(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ E (5) D සහ E (……)

- ප්ලේබියන්වරුන්ගේ පීඩාවන් දුරු කිරීම පිණිස පැනවූ නීති සඳහන් කරන පහත සඳහන් ප්‍රකාශ කියවා **18** සිට **20** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ලෙක්ස් කැනුලෙයියා (Lex Canuleia) ක්‍රි.පූ. 445

B - ලෙක්ස් හෝර්ටෙන්ෂියා (Lex Hortensia) ක්‍රි.පූ. 287

C - ලෙක්ස් ඔගුල්නියා (Lex Ogulnia) ක්‍රි.පූ. 300

D - ලෙක්ස් වැලේරියෝ ඩෙ ප්‍රොවොකැටියෝනෙ (Lex Valario de Provocatione) ක්‍රි. පූ. 509

E - වැලේරියෝ - හොරේෂියානු නීති (Valerio-Horesian laws) ක්‍රි. පූ. 449

**18.** ඉහත දැක්වෙන කුමන නීතිය මගින් පැට්‍රිෂියන්වරු තම සිතැඟි පරිදි බලය යොදා ගැනීමෙන් වූ හානියෙන් ප්ලේබියන්වරුන්ව ආරක්ෂා කළේ ද?

(1) A (2) B (3) C (4) D (5) E (……)

**19.** ඉහත දැක්වෙන කුමන නීතිය මගින් පැට්‍රිෂියන්වරුන් සහ ප්ලේබියන්වරුන් අතර විවාහයට අනුමැතිය ලැබුණේ ද?

(1) A (2) B (3) C (4) D (5) E (……)

**20.** ඉහත දැක්වෙන කුමන නීතිය නිසා ප්ලෙබියානු එසෙම්බ්ලියට පූර්ණ අධිකරණ නිදහසත් කොමිටියා ට්‍රිබියුටාවට රජයේ උසස්ම අධිකරණ බලයත් හිමිවී ද?

(1) A (2) B (3) C (4) D (5) E (……)

0585

**21.** ග්‍රැකයි සහෝදරයින්ගේ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට කෙටි කලකට පෙර ඉතාලියේ පැවති තත්ත්වය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** පහත දැක්වෙන කුමන ප්‍රකාශය ද?
(1) වගාවෙන් ලාභයක් නොමැති නිසා කුඩා ඉඩම් හිමියන් ඔවුන්ගේ ඉඩම් විකුණා දමමින් සිටීම
(2) ධනවත් ඉඩම් හිමියන් මහා පරිමාණයෙන් වගා කටයුතු හඳුන්වා දීම
(3) නිදහස් රෝම ජනයා ස්වේච්ඡාවෙන්ම පිටිසර ප්‍රදේශ වෙත යෑම
(4) ගොවියන් බොහෝමයක් සොල්දාදුවන් බවට පත් වීම
(5) ලිසීනියානු නීති ඇඩි ලෙස ක්‍රියාවේ යෙදවීම (……)

**22.** ටයිබීරියස් ග්‍රැකස්ගේ ව්‍යවස්ථා විරෝධී ක්‍රියා පිළිබඳව සඳහන් වන්නේ පහත දැක්වෙන කුමන ප්‍රකාශයේ ද?
(1) කිසිම පුද්ගලයෙකුට යුගේරා 500 කට වඩා ඉඩම් අයත් කර ගැනීමට අවසර නොදීම
(2) නීත්‍යානුකූලව අවසර තිබූ ප්‍රමාණයට වඩා ඉඩම් හිමිවූවන්ට සාධාරණ වන්දියක් මත වැඩිපුර ඉඩම් රජයට ලබා දෙන ලෙස ඉල්ලා සිටීම
(3) රජය ලබාගත් වැඩි ඉඩම් යුගේරා 30 ක කැබලි ලෙසින් දිළිඳු ජනතාව අතර බෙදා දීම
(4) නීති ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස්වරුන් තිදෙනෙක් වාර්ෂිකව පත් කිරීම
(5) ටයිබීරියස්ගේ කෘෂිකාර්මික පනතට (agrarian bill) විරුද්ධ වූ ඔක්ටේවියස්ව ප්ලෙබියන් එසෙම්බ්ලියේ දී ජනතා ඡන්දයෙන් පිටුවහල් කිරීමට ක්‍රියා කිරීම (……)

**23.** කායස් ග්‍රැකස්ගේ ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** පහත දැක්වෙන කුමන ප්‍රකාශය ද?
(1) තම සහෝදරයාගේ කෘෂිකාර්මික නීති (agrarian laws) නැවත ප්‍රාණවත් කිරීම
(2) වෙළෙඳ වටිනාකමට වඩා අඩු මිලකට නගරවාසීන්ට තිරිඟු අලෙවි කිරීමට යෝජනා කිරීම
(3) රෝම සෙනෙට් සභාවේ බලතල වැඩි කිරීම
(4) රජයේ වියදමින් සොල්දාදුවන් සන්නද්ධ කිරීම ප්‍රකාශයට පත් කිරීම
(5) ඉතාලියේ සහ පිටිසර ප්‍රදේශවල ජනපද ස්ථාපිත කිරීමට යෝජනා කිරීම (……)

**24.** පහත ප්‍රකාශ අතරින් ලෙගෙස් කෝර්නීලායි පිළිබඳව සඳහන් කරන්නේ කුමන ප්‍රකාශ දෙක ද?
A - මේරියස් පැනවූ නීති
B - සුල්ලා පැනවූ නීති
C - මෙනමින් හැඳින්වූ නීතිවල අපේක්ෂාව වූයේ සෙනෙට් සභාවේ බලතල දුර්වල කිරීමයි.
D - මෙනමින් හැඳින්වූ නීතිවල අපේක්ෂාව වූයේ ට්‍රයිබියුනේටයේ බලතල දුර්වල කිරීමයි.
E - මෙනමින් හැඳින්වූ නීති මගින් රෝම නිලධාරීන්ගේ අධිකාරිය ශක්තිමත් කිරීම.

(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D (5) B හා E (……)

**25.** සුල්ලාගේ පරිපාලනමය ප්‍රතිසංස්කරණ පිළිබඳව සඳහන් **නොවන්නේ** පහත දැක්වෙන කුමන ප්‍රකාශය ද?
(1) සිවිල් සහ හමුදා බලධාරීන්ගේ වගකීම් වෙන් කර දැක්වීම
(2) කොන්සල්වරුන් සහ ප්‍රයටර්වරුන් තම වාර්ෂික පත්වීමේ වගකීම රෝමයේ නැවතී සිටිමින් ඉටු කළ යුතු ලෙසට නීතියක් පැනවීම
(3) රෝම නිලධාරීන්ගේ ගණන වැඩි කිරීම
(4) මහජන සභාවලට සාපරාධී කරුණු පිළිබඳ අධිකරණ කටයුතු කිරීමට බලය පැවරීම ස්ථාපිත කිරීම
(5) ප්‍රාදේශීය ආණ්ඩුකාරවරුන්ට හුදෙක් තම අභිප්‍රාය මත යුද්ධ කිරීම තහනම් කිරීම (……)

**26.** පොම්පේ,
(1) සුල්ලාට විරුද්ධව සිවිල් යුද්ධයේ සටන් කළේ ය.
(2) මුහුදු කොල්ලකරුවන් මැඩපවත්වා මිත්‍රිඩාටෙස් පරාජය කළේ ය.
(3) මේරියස්ට ශක්තියක් වීම සඳහා සිසිලියට සහ අප්‍රිකාවට යවන ලදී.
(4) ලෙපිඩුස්ගේ කැරැල්ලේදී ඔහුට සහාය වන ලදී.
(5) සර්ටෝරියස්ට එක්වීම පිණිස ස්පාඤ්ඤයට යවන ලදී. (……)

**27.** සිසරෝ පිළිබඳව නිවැරදි වන්නේ පහත දැක්වෙන කවර ප්‍රකාශය ද?
(1) ඔහු රෝම රදළ පන්තියට අයත් විය.
(2) ඔහුගේ මුතුන්මිත්තන් සියලු දෙනාම රෝම ආණ්ඩුවේ ක්‍යුරයිල් (*curule*) පදවියක් දැරූහ.
(3) සිවිල් යුද්ධයේ සටන් කිරීමෙන් ඔහුගේ හමුදා වෘත්තිය ආරම්භ කළේ ය.
(4) සිසිලියේ දී වෙරිස් සිදු කළ අසාධාරණ අය කිරීම් මත වෙරිස්ට එරෙහිව ගෙනා දෝෂාභියෝගය නිසා ප්‍රසිද්ධ විය.
(5) ක්‍රි. පූ. 63 දී සෙන්සර් පදවියට පත් විය. (……)

[6 වැනි පිටුව බලන්න/பக். 6 ஐப் பார்க்க/See page six

**28.** පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කුමන ප්‍රකාශයක් කැටිලිනාගේ කුමන්ත්‍රණයට හේතු වූ තත්ත්ව පිළිබඳව නිවැරදි **නොවන්නේ** ද?
(1) සුල්ලාගේ පළපුරුදු සෙබළුන් සැහැසිකම් සිදු කිරීමට සූදානමින් සිටීම
(2) සුල්ලාගේ රාජසන්තක කිරීම්වලින් පීඩා විඳි මිනිසුන් විප්ලවකාරී ක්‍රියා පිළිගැනීමට සූදානමින් සිටීම
(3) දරිද්‍රතාවයට පත් රදළ තරුණයින් ඔවුන්ගේ ණයෙන් මිදීම සඳහා වෙනසක් වනතුරු නොඉවසිල්ලෙන් බලා සිටීම
(4) රෝමයේ වූ විධායක ආණ්ඩුව දුර්වල තත්ත්වයේ පැවතීම
(5) ධනවත් බලවතුන් රෝමයේ පොදු ජනතාවගේ ආදර ගෞරවයට පාත්‍ර වීම (……)

- පළමුවන සහ දෙවන ට්‍රයම්විරේට පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ **29** සහ **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ට්‍රයම්විරේටය ජූලියස් සීසර්, පොම්පේ සහ ක්‍රැසස්ගෙන් සමන්විත වීම
B - ට්‍රයම්විරේටය ඔක්ටේවියස්, පොම්පේ සහ ක්‍රැසස්ගෙන් සමන්විත වීම
C - ට්‍රයම්විරේටය ජූලියස් සීසර්, මාර්ක් ඇන්තනී සහ ලෙපිඩුස්ගෙන් සමන්විත වීම
D - කැම්පේනියාවේ මහජන ඉඩම්වල දිළිඳු ජනතාව පදිංචි කරවීම
E - ට්‍රයම්විර්වරුන්ගේ හතුරන් ඝාතනය කර ඔවුන්ගේ දේපළ රාජසන්තක කිරීම

**29.** ඉහත දැක්වෙන ප්‍රකාශ අතරින් කුමන ප්‍රකාශ **දෙක** පළමු ට්‍රයම්විරේටය පිළිබඳව සඳහන් කරන්නේ ද?
(1) A සහ D (2) A සහ E (3) B සහ D (4) C සහ D (5) C සහ E (……)

**30.** ඉහත දැක්වෙන ප්‍රකාශ අතරින් කුමන ප්‍රකාශ **දෙක** දෙවන ට්‍රයම්විරේටය පිළිබඳව සඳහන් කරන්නේ ද?
(1) A සහ D (2) A සහ E (3) B සහ D (4) C සහ D (5) C සහ E (……)

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

- කෙටි පිළිතුරු සපයන්න.

**31.** හිසියඩ් තම **වැඩපළ හා දින නිමිති** කෘතියේ නරක අරගලයේ (Bad Strife) ස්වභාවය පිළිබඳව විස්තර කරන ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

**32.** හිසියඩ්ගේ **වැඩපළ හා දින නිමිති** කෘතියේ සඳහන් වන පරිදි සියුස් දෙවියන්ගේ උපදෙස්වලට අනුව පළමු කාන්තාවගේ රූපය සෑදීමට හෙෆයස්ටස් භාවිත කළ අමුද්‍රව්‍ය මොනවා ද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

**33.** (i) හිසියඩ් තම **වැඩපළ හා දින නිමිති** කෘතියට අනුව සියුස් දෙවියන් විසින් මැවූ දෙවන වංශය කුමක් ද?

……………………………………………………………………………………………

(ii) සියුස් දෙවියන් ඒවා වංශ පහේ පුරාවෘත්තයේ සැඟවූයේ කුමන හේතුවක් නිසා ද?

……………………………………………………………………………………………

**34.** (i) හිසියඩ් **වැඩපළ හා දින නිමිති** කෘතියේ සඳහන් කරන අන්දමට යම් කලකදී ඔහු මුහුදේ යාත්‍රා කළේ කොතැනක සිට ද?

……………………………………………………………………………………………

(ii) ඒ කුමන අරමුණක් සඳහා කුමන ස්ථානයකට ද?

……………………………………………………………………………………………

**35.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** නාට්‍යයේ ප්‍රොක්ලියොන්ගේ 'නෝ මැන්' පිළිතුර මගින් ගෙන දක්වන්නේ කුමන මිත්‍යා කථාව ද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

0585

**36.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** නාට්‍යයේ ඇන්ටික්ලියොන් තම පියා වන ප්‍රොක්ලියොන් වෙනුවෙන් සූදානම් කරන සාවද්‍ය නඩු විභාගයේ විත්තිකරු වන ලාබේස්ට විරුද්ධව ගෙන එන චෝදනාව කුමක් ද? ඒ සඳහා යෝජනා කරන දඬුවම කුමක් ද?

.................................................................................................................................

.................................................................................................................................

**37.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** නාට්‍යයේ දැක්වෙන සාවද්‍ය නඩු විභාගය අවසානයේ දී ප්‍රොක්ලියොන් සිහි විසඥවන්නේ ඇයි?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**38.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** නාට්‍යයේ නෙයොප්ටොලමස් තමා ඇකිලීස්ගේ පුත්‍රයා ලෙසින් ෆිලෝක්ටිටීස්ට හඳුන්වා දුන් විට ෆිලෝක්ටිටීස්ගේ මතකයට ආවේ කුමක් ද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**39.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** නාට්‍යයේ ට්‍රෝයි නගරයට ගොස් ට්‍රෝජන්වරුන්ට එරෙහි යුද්ධය ජයගැනීමට ග්‍රීකවරුන්ට සහාය දීමට ෆිලෝක්ටිටීස් පෙළඹෙන්නේ කුමක් නිසා ද?

.................................................................................................................................

.................................................................................................................................

**40.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** නාට්‍යයේ ෆිලෝක්ටිටීස්ව රැවටීමට යොදාගත් උපක්‍රමයේ කොටසක් ලෙසින් නෙයොප්ටොලමස් ඔඩිසියස් තමාට කළ වෙනස්කම් සහ අවමාන පිළිබඳව ෆිලෝක්ටිටීස්ට පැවසූ විට ෆිලෝක්ටිටීස් ඔඩිසියස්ව විස්තර කරන්නේ කෙසේ ද?

.................................................................................................................................

.................................................................................................................................

**41.** යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ දැක්වෙන පූර්විකාව අවසානයේ ඇඩ්මීටස්ගේ මාලිගය වෙත එන පුද්ගලයෙක් පිළිබඳව ඇපලෝ දෙවියන් අනාවැකියක් පළ කරයි. එම අනාවැකියට අනුව,

(i) එම පුද්ගලයා එවන්නේ කවුරුන් විසින් කුමක් සඳහා ද?

.................................................................................................................................

(ii) ඇඩ්මීටස්ගේ මාලිගයේ දී ඔහුගෙන් අපේක්ෂා කරන කාර්යය කුමක් ද?

.................................................................................................................................

**42.** (i) යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ ඇඩ්මීටස් තම පියා ෆෙරීස්ට තම බිරිඳ වූ ඇල්සෙස්ටීස්ගේ මළගමට සහභාගි වීමට ආරාධනා නොකරන්නේ ඇයි?

.................................................................................................................................

(ii) මෙම හේතුවට එරෙහිව ෆෙරීස් ගෙන එන තර්කය කුමක් ද?

.................................................................................................................................

**43.** ටෙරන්ස්ගේ **ද මදර්-ඉන්-ලෝ** නාට්‍යයේ ආරම්භක ජවනිකාවේ පෙනී සිටින (i) අනුකූල **නොවන** ගතිගුණයෙන් යුත් ගණිකාව සහ (ii) ගණිකා වෘත්තියට අනුකූල ගතිගුණයෙන් යුත් ගණිකාව කවුරුන් ද?

(i) ...........................................................................................................

(ii) ...........................................................................................................

**44.** ටෙරන්ස්ගේ **ද මදර්-ඉන්-ලෝ** නාට්‍යයේ අලුත් බිළිඳාගේ උපත සැඟවීමට උත්සාහ කරන්නේ කුමන චරිත ද?

...........................................................................................................

...........................................................................................................

**45.** ටෙරන්ස්ගේ **ද මදර්-ඉන්-ලෝ** නාට්‍යයේ පාර්මෙනෝ දන්නා නමුත් මාමාවරුන් නොදන්නා සහ එය නොදන්නාකම නිසාම අලුත් බිළිඳා සුජාත දරුවකු ලෙසින් පිළිගැනීමට මාමාවරුන් පොළඹවන තොරතුර කුමක් ද?

...........................................................................................................

**46.** ටෙරන්ස්ගේ **ද මදර්-ඉන්-ලෝ** නාට්‍යයේ පැම්ෆීලස් තම දරුවා සහ බිරිඳ භාර ගැනීම ප්‍රතික්ෂේප කරන විට මාමාවරුන් දෙදෙනා ප්‍රශ්නය නිරාකරණය කිරීමට අදහස් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

...........................................................................................................

...........................................................................................................

**47.** **කැටිලිනාට එරෙහිව** සිසරෝ පැවැත්වූ තුන්වන කථාවට අනුව කැටිලිනාගේ සහචරයින් පිළිබඳව තමාට දැනගැනීමට ලැබුණු ලෙස සිසරෝ දක්වන්නේ කුමක් ද?

...........................................................................................................

...........................................................................................................

**48.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව,

(i) ආර්ගෝ නෞකාව නිපදවූයේ කවු ද?

...........................................................................................................

(ii) ඒ කුමන දෙවියන්ගේ අධීක්ෂණය යටතේ ද?

...........................................................................................................

**49.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව,

(i) අන්ධ අනාගත වක්තෘ ෆීනියාස් කුමන ගැටලුවකින් පීඩා වින්දේ ද?

...........................................................................................................

(ii) ආර්ගෝනෝට්වරුන් අතරින් කවරෙකු ඔහුව ඉන් ගළවා ගත්තේ ද?

...........................................................................................................

**50.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව ආර්ගොනෝට්වරුන් කොල්කිස්වල සිට එන ගමනේදී මීඩියා ඔවුන් සමග පැන යෑම පහසු කිරීම සඳහා ජේසන්ට ඇය උපදෙස් දෙන්නේ කවුරුන්ව මරා දමන ලෙසට ද?

...........................................................................................................

* * *

[9 වැනි පිටුව බලන්න/பக். 9 ஐப் பார்க்க/See page nine

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

0585

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

**NEW/OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය II
கிரேக்க, உரோம நாகரிகம் II
Greek and Roman Civilization II

48 STE II

2019.08.31 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

Use **additional reading time** to go through the question paper, select the questions and decide on the questions that you give priority in answering.

**උපදෙස්:**

※ පහත දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.

※ **පළමුවන සහ සයවන ප්‍රශ්න අනිවාර්ය වේ.** ඊට අමතරව **I** කොටසේ **A** උපකොටසෙන් **එක්** ප්‍රශ්නයක් ද **B** උපකොටසෙන් **එක්** ප්‍රශ්නයක් ද **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

※ **සියලු ම** ප්‍රශ්නවලට **එක් භාෂාවකින්** පිළිතුරු සපයන්න.

## I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

1. පහත සඳහන් මාතෘකාවලින් **පහක්** තෝරාගෙන, ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න. එක් මාතෘකාවකට අවම වශයෙන් කරුණු **හතරක්වත්** අඩංගු විය යුතු ය.

(i) එෆෝර්ස්
(ii) ක්‍රිප්ටෙයියා
(iii) තෙමිස්ටොක්ලීස්
(iv) ඩීලියානු එක්සත් මණ්ඩලය
(v) එපමිනොන්ඩාස්
(vi) රෝම කොන්සල් පදවිය
(vii) මේරියස්
(viii) ග්ලැඩියේටර්වරු
(ix) දෙවන ත්‍රයම්විරේටය
(x) ඔගස්ටස් සීසර්

(ලකුණු 04 × 5 = 20යි.)

### A උපකොටස - ග්‍රීක ඉතිහාසය

2. (i) ඇතැන්ස්හි සෝලෝන්ගේ ප්‍රතිසංස්කරණ නිසා ඇති වූ ප්‍රතිඵල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්ලයිස්තනීස් ඇතීනියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයක් බවට පත් කළේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(iii) පෙරික්ලීස්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ඔහුගේ අරමුණ සහ ප්‍රතිපත්තිය ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

3. (i) 'පෙලොපනීසියානු' යුද්ධයට ඇතිවීමට තුඩු දුන් දුරස්ථ හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඇතන්ස් රාජ්‍යයේ සිසිලියානු ආක්‍රමණය අසාර්ථක වූයේ මන්දැ'යි කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iii) පෙලොපොනීසියානු යුද්ධයට පසුව ඇතන්ස්හි වූ දේශපාලන තත්ත්වය අගයන්න. (ලකුණු 07 යි)

[දෙවෙනි පිටුව බලන්න / பக். 02 ஐப் பார்க்க / See page two

## B උපකොටස - රෝම ඉතිහාසය

**4.** (i) මුල් වකවානුවේ දී පියුනික් යුද්ධය කිනම් වූ බලව්‍යාප්ත වන අධිරාජ්‍ය දෙකක් අතර කුමක් දිනා ගැනීම සඳහා ඇති වූ අරගලයක් සේ දිස් වූයේ ද? (ලකුණු 03 යි)

(ii) දෙවන පියුනික් යුද්ධයට තුඩු දුන් හේතු කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iii) දෙවන-පියුනික් යුද්ධයේ දී හැනිබාල් පරාජය වූයේ ඇයි දැයි ඔබ සිතන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

**5.** (i) මුන්ඩා සටනෙන් පසුව ජූලියස් සීසර්ගේ තත්ත්වය ඉතා කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) රෝමයේ ඉහළම බලය හිමි කර ගැනීමට ජූලියස් සීසර් යොමු වීමට පසුබිම් වූ කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) ජූලියස් සීසර්ගේ සමාජයීය සහ දේශපාලන ප්‍රතිසංස්කරණ ඒවා රෝම ආණ්ඩුව ජනරජයක සිට අධිරාජ්‍යවාදී බලයක් දක්වා වෙනස් කළ ආකාරය ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

**6.** **ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයෙහි 6 (a) සිට 6 (g) තෙක්** වූ උද්ධෘත පාඨ අතුරෙන් **පහක්** තෝරාගෙන, ඒවායේ අවස්ථා සම්බන්ධය පෙන්වා, විෂය කරුණු පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 04 × 5 = 20යි.)

**7.** (i) යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ ඇල්සෙස්ටිස් රැජින මිය ගිය බව දැන ගැනීම පිණිස ෆෙරියානු නගර වැසියන්ගෙන් යුතු ගීතිකා කණ්ඩායම අවධානය යොමු කරන්නේ කිනම් සාධක වෙත ද (ලකුණු 03 යි)

(ii) යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යය සඳහා හෙරක්ලීස්ගේ චරිතයේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iii) යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ එන වහල් චරිත දෙකෙහි භූමිකාව නාට්‍යය ඇසුරින් අගයන්න. (ලකුණු 07 යි)

**8.** (i) ඇපලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව ආර්ගොනෝට්වරුන් කොල්කිස් බලා යන ගමනේ දී නැවතුන පළමු ස්ථාන **තුන** නම් කර එම ස්ථානවල දී ඔවුන් සිදු කළ හෝ ඔවුන්ට මුහුණ පෑමට සිදු වූ දේවල් වෙන් වෙන් ව ඉතා කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඇපලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව කොල්කිස්හිදී ජේසන් රත්රන් බැටළු හම ඉල්ලා සිටි විටදී ඒටීස් ජේසන්ට ලබා දුන් අභියෝගය කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) "ජේසන් ක්‍රියා කළේ සත්‍ය ආලය තුළින් නොව කාලානුරූපී දිව්‍යමය මැදිහත්වීම් තුළ ය." ඇපලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයේ එන ජේසන් සහ මිඩීයා ආදර කථාව ඇසුරින් අදාළ කෘතියෙන් අවැසි සාක්ෂි ගෙන දක්වමින් මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 07 යි)

**9.** (i) **කැටිලිනාට එරෙහිව** පැවැත්වූ ප්‍රථම කථාවේ දී සිසරෝ තම ප්‍රෙක්ෂකයන්ට ගෙන දක්වන තර්ක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) **කැටිලිනාට එරෙහිව** පැවැත්වූ දෙවන කථාවේ දී සිසරෝ තම ප්‍රෙක්ෂකයන් හමුවේ ඔප්පු කිරීමට යන දේ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iii) සිසරෝගේ ව්‍යක්තභාවය පිළිබඳ හැකියාව ඔහු **කැටිලිනාට එරෙහිව** පැවැත්වූ කථාවලින් පිළිබිඹු වන ආකාරය අදාළ කෘතියෙන් ලබා ගත් සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

[තුන්වෙනි පිටුව බලන්න/பக். 03 ஐப் பார்க்க/*See page three*